## දෙවැනි පරිශිෂ්ඨය

මුදල් මණ්ඩලය විසින් 1975 දී උපයෝගී කර ගනු ලැබූ ප්‍රධාන පරිපාලන විධිවිධාන.


1. සංචිත අවශ්‍යතා – 'ඩී', 'ජී' සහ 'එච්' රෙගුලාසි – චක්‍රලේඛ අංක 92 .. (i)
2. වෙළෙඳ බැංකු ණය–චක්‍රලේඛ අංක 93 .. .. (ii)
3. සංචිත අවශ්‍යතා - 'ඩී' රෙගුලාසිය - චක්‍රලේඛ අංක 95 .. (iii)
4. සංචිත අවශ්‍යතා 'ඩී' රෙගුලාසිය – චක්‍රලේඛ අංක 95A .. (iv)
5. සංචිත අවශ්‍යතා 'ඩී' රෙගුලාසිය – චක්‍රලේඛ අංක 100 .. (v)
6. එ. ජ. ඩොලර් සඳහා මහ බැංකුවේ විනිමය අනුපාතික .. (vi)
7. ආසියානු මූල්‍ය ඒකකය, බංගලිදේශ ටාකා, ඉන්දියානු රුපියල, අයිරාන රියාල්, නේපාල රුපියල හා පකිස්ථානු රුපියල සඳහා මහ බැංකු විනිමය අනුපාතික (vii)
8. ආසියානු මූල්‍ය ඒකකය, බංගලිදේශ ටාකා, ඉන්දියානු රුපියල, අයිරාන රියාල්, නේපාල රුපියල හා පකිස්ථානු රුපියල සඳහා වෙළෙඳ බැංකු විනිමය අනුපාතික .. .. (viii)
9. ඉන්දියානු රුපියල හා ස්ටර්ලිං පවුම සඳහා මහ බැංකුවේ විනිමය අනුපාතික (ix)
10. වෙළෙඳ බැංකුවල විනිමය අනුපාතික .. .. (x)

චක්‍ර ලේඛ අංක 92.

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. අංක 590,
කොළඹ 1.
1975 අප්‍රේල් මස 08 වැනි දින.

**සංචිත අවශ්‍යතා - 'ඩී', 'ජී' සහ 'එච්' රෙගුලාසි.**

i. කලින් කල සංශෝධනය කරනු ලැබුවාවූද, 1961 පෙබරවාරි 01 වැනි දින හා අංක 12,280 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද්දවූ ද 'ජී' රෙගුලාසිය සහ

ii. 1965 ජුනි 09 වැනි දින හා අංක 14,420 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද'එච්' රෙගුලාසිය අවලංගු කරමින් ද,

1950 අගෝස්තු 28 වැනි දින හා අංක 10,143 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ 'ඩී' රෙගුලාසිය සංශෝධනය කරමින් ද, 1975 අප්‍රේල් 07 වැනි දින හා අංක 158/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ දැක්වෙන නිවේදන කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ. ඒ අනුව, 1961 ජුලි 24 වැනි දින හා අංක 14 සහ 1961 සැප්තැම්බර් 25 වැනි දින හා අංක 16 දරන චක්‍රලේඛ ලිපි මෙයින් අවලංගු කරනු ලැබේ.

'ජී' සහ 'එච්' රෙගුලාසි යටතේ මෙතෙක් අවශ්‍ය වූ විශේෂ සංචිතයන් තවදුරටත් පවත්වා ගැනීමට මේ අනුව වෙළෙඳ බැංකුවලින් අවශ්‍ය නොකෙරේ. එහෙත් 'ඩී' රෙගුලාසි යටතේ පවත්වා ගත යුතු සංචිතයන් 1975 අප්‍රේල් 23 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, මහ බැංකුව වෙත වූ රුපියල් තැන්පතු ස්වරූපයෙන් පමණක් පවත්වා ගත යුතුය.

ජ්. බණ්ඩාරනායක
ප්‍රධාන ගණකාධිකාරී.

එච්. ඊ. තෙන්නකෝන්
අධිපති

චක්‍ර ලේඛ අංක 93.

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. අංක 590,
කොළඹ 1.
1975 අප්‍රේල් මස 08 වැනි දින.

## වෙළෙඳ බැංකු ණය.

වෙළෙඳ බැංකුවක් විසින් මහ බැංකුව වෙතින් ණය ලබා ගන්නා ලදුව පියවීමට ඇති ණය මට්ටම 1974 දෙසැම්බර් 31 වැනි දිනට එම බැංකුවේ පහත සඳහන් වත්කම් අයිතමයන්ගේ එකතුවෙන් 8% කට වැඩි නොවිය යුතු යයිද මෙම නියමය අද සිට ක්‍රියාත්මක විය යුතු යයි ද වෙළෙඳ බැංකු වෙත මෙයින් දන්වනු ලැබේ.

1. වට්ටම් කරන ලද හා මූලනය කරන ලද බිල්පත්,

2. ණය (රජයේ කෘෂිකාර්මික ණය ක්‍රමයන් යටතේ දෙන ලද ණය හැර) සහ,

3. අයිරා.

මහ බැංකුවෙන් ණය ගන්නා ලදුව අද දිනට බැංකුවක් විසින් පියවිය යුතුව ඇති ණය ප්‍රමාණය නියමිත සීමාව ඉක්මවන්නේ නම් එම අතිරික්ත ප්‍රමාණය වහාම ගෙවීමට එම බැංකුවට නියම නොකරන නමුත් පියවීමට ඉතිරිව ඇති ණය ප්‍රමාණය යට කී සීමාව තුළට ගෙනෙන තෙක් එම බැංකුවට අළුතින් අත්තිකාරම් දෙනු නොලබන්නේය යන විධිවිධානයට මෙය යටත් වේ. මෙම කරුණෙහි ලා, 'මහ බැංකුව වෙතින් ණය ගැනීම' යන්නට රජයේ කෘෂිකාර්මික ණය ක්‍රම, මිල සහතික ක්‍රමය සහ මැදිකාලීන හා දිගුකාලීන ණය අරමුදල යටතේ දෙන ලද ප්‍රතිමූල්‍යාප්ජන ඇතුළත් නොවේ.

කෙසේ වුවද, තාවකාලික මුදල් හිඟයන් මගහරවා ගැනීමට බැංකුවලට හැකිවනු වස් නියමිත සීමාව ඉක්මවන පහසුකම් සඳහා වෙළෙඳ බැංකු විසින් ඉදිරිපත් කරන අයදුම් පත් සලකා බැලීමට මහ බැංකුව සූදානම් ය. එවැනි පහසුකම් ලබා දෙනුයේ ඉතා කෙටි කාල සීමාවන් සඳහා ය. ඒ සඳහා වන පොලී අනුපාතිකය බැංකු අනුපාතිකයට වඩා 2½% ක අනුපාතිකයක් වේ.

1974 මැයි 27 වැනි දින හා අංක 82 දරන මහ බැංකු චක්‍ර ලේඛය මෙයින් අවලංගු කරනු ලැබේ. කෙසේ වුවද, 1974 දෙසැම්බර් 31 වැනි දිනට නොබේරා ඉතිරිව ඇති ණය හා අත්තිකාරම් මට්ටම ඉක්මවා පරිභෝජනය, සමපේක්ෂණ තොග ගොඩනැංවීම වැනි අත්‍යවශ්‍ය නොවන අරමුණු සඳහා ණය හා අත්තිකාරම් වැඩි නොකරන මෙන් බැංකුවලට නියම කරනු ලැබේ.

ඒ. බණ්ඩාරනායක
ප්‍රධාන ගණකාධිකාරී.

එච්. ඊ. තෙන්නකෝන්
අධිපති.

චක්‍ර ලේඛ අංක 95.

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. අංක 590,
කොළඹ 1.
1975 අප්‍රේල් මස 23 වැනි දින.

## සංචිත අවශ්‍යතා - 'ඩී' රෙගුලාසිය

1975 අප්‍රේල් 07 වැනි දින හා අංක 158/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කෙරුණු 'ඩී' රෙගුලාසියේ සංශෝධනය ක්‍රියාත්මක වන දිනය 1975 ජූලි 21 වැනි දිනට වෙනස් කරමින් 1975 අප්‍රේල් 22 වැනි දින හා අංක 160/62 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ දැක්වෙන නිවේදනය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

1961 ජූලි 24 වැනි දින හා අංක 14 දරන අපගේ චක්‍රලේඛයෙහි විස්තර කර ඇති පරිදි 1975 මැයි 20 වැනි දින තෙක් නියමිත සංචිතයන්ගෙන් 75% කට නොවැඩි ප්‍රමාණයක් ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවල ස්වරූපයෙන් ඔබගේ බැංකුවට තවදුරටත් පවත්වා ගත හැකිය. ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවල ස්වරූපයෙන් දරන නියමිත සංචිත සමානුපාතය 1975 මැයි 21 වැනි දින සිට 1975 ජූනි 20 වැනි දින දක්වා 50% ක්ද, 1975 ජූනි 21 වැනි දින සිට 1975 ජූලි 20 වැනි දින දක්වා 25% ක් ද නොඉක්මවිය යුතුය. 1975 ජූලි 21 වැනි දින සිට නියමිත සංචිතයන් සම්පූර්ණ වශයෙන්ම ඔබ බැංකුව විසින් මහ බැංකුව වෙත වූ තැන්පතු වල ස්වරූපයෙන් පවත්වා ගත යුතු ය.

ඒ. බණ්ඩාරනායක
ප්‍රධාන ගණකාධිකාරී.

එච්. ඊ. තෙන්නකෝන්
අධිපති.

චක්‍රලේඛ අංක. 95 ඒ.

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1975 අප්‍රේල් 23 වැනි දින.

## සංචිත අවශ්‍යතා – "ඩී" රෙගුලාසිය

1975 අප්‍රේල් 07 වැනි දින හා අංක 158/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කෙරුන "ඩී" රෙගුලාසියේ සංශෝධනය ක්‍රියාත්මක වන දිනය 1975 ජූලි 21 වැනි දිනට වෙනස් කරමින් 1975 අප්‍රේල් 22 වැනි දින හා අංක 160/62 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ දැක්වෙන නිවේදනය කෙරෙහි ඔබගේ අවධානය යොමුකරනු ලැබේ.

1975 මැයි 20 වැනි දිනතෙක් නියමිත සංචිතයන්ගෙන් 75% කට නොවැඩි ප්‍රමාණයක් ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවල ස්වරූපයෙන් ඔබගේ බැංකුවට තවදුරටත් පවත්වා ගත හැකිය. ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවල ස්වරූපයන් දරන නියමිත සංචිත සමානුපාතය 1975 මැයි 21 වැනි දින සිට 1975 ජූනි 20 වැනි දින දක්වා 50% ක් ද, 1975 ජූනි 21 වැනි දින සිට 1975 ජූලි 20 වැනි දින දක්වා 25% ක් ද නොඉක්මවිය යුතුය. 1975 ජූලි 21 වැනි දින සිට නියමිත සංචිතයන් සම්පූර්ණ වශයෙන්ම ඔබ බැංකුව විසින් මහ බැංකුව වෙත වූ තැන්පතුවල ස්වරූපයෙන් පවත්වාගත යුතු ය.

ඒ. බණ්ඩාරනායක
ප්‍රධාන ගණකාධිකාරී.

එච්. ඊ. තෙන්නකෝන්
අධිපති.

චක්‍රලේඛ අංක 100.

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1975 ජූලි 25 වැනි දින.

## සංචිත අවශ්‍යතා - ''ඩී'' රෙගුලාසිය

1975 අප්‍රේල් 7 වැනි දින හා අංක 158/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකෙරුන 'ඩී'' රෙගුලාසියේ සංශෝධනය ක්‍රියාත්මක වන දිනය 1975 දෙසැම්බර් 31 වැනි දිනට වෙනස් කරමින් 1975 ජූලි 21 වැනි දින හා අංක 173/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ දක්වෙන නිවේදනය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

නියමිත සංචිතයන්ගෙන් 75% කට නොවැඩි ප්‍රමාණයක් 1975 දෙසැම්බර් 31 වැනි දින තෙක් ඔබගේ බැංකුවට ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවල ස්වරූපයෙන් තවදුරටත් පවත්වාගත හැකිය.

ඒ. බණ්ඩාරනායක
ප්‍රධාන ගණකාධිකාරී.

එච්. ඊ. තෙන්නකෝන්
අධිපති.

## එ. ජ. ඩොලර් සඳහා මහ බැංකුවේ විනිමය අනුපාතික

| චක්‍රලේඛ අංකය හා ක්‍රියාත්මක වීමේ දිනය | විදුලි පණිවුඩ පැවරුම් සඳහා මහ බැංකු මිලදී ගැනීමේ එතැන් අනුපාතික | විදුලි පණිවුඩ පැවරුම් සඳහා මහ බැංකු විකිණීමේ එතැන් අනුපාතික |
|---|---|---|
| | ඩොලර් 100 කට රුපියල් | |
| 1/239<br>1974 ඔක්තෝබර් 2 | 663·70 | 668·95 |
| 1/240<br>1975 ජනවාරි 9 | 662·45 | 662·70 |
| 1/241<br>1975 ජනවාරි 29 | 649·75 | 650·00 |
| 1/242<br>1975 මාර්තු 5 | 640·60 | 640·35 |
| 1/243<br>1975 අප්‍රේල් 9 | 655·20 | 655·45 |
| 1/244<br>1975 මැයි 14 | 678·75 | 679·00 |
| 1/245<br>1975 ජූනි 19 | 686·65 | 686·90 |
| 1/246<br>1975 ජූලි 1 | 710·75 | 711·00 |
| 1/247<br>1975 අගෝස්තු 5 | 728·15 | 728·40 |
| 1/248<br>1975 අගෝස්තු 15 | 739·40 | 739·65 |
| 1/249<br>1975 සැප්තැම්බර් 24 | 753·05 | 753·30 |
| 1/250<br>1975 නොවැම්බර් 27 | 765·55 | 765·80 |
| 1/251<br>1975 දෙසැම්බර් 10 | 770·80 | 771·05 |

තෙමස දක්වා ඉදිරි මිලදී ගැනීම් අනුපාතිකය – එතැන් මිලදී ගැනීමේ අනුපාතිකයෙන් වෙනස් නොවේ.

තෙමස දක්වා ඉදිරි විකිණීමේ අනුපාතිකය – එතැන් විකිණීම් සඳහා අධි මිල මසකට /50.

තෙමසකට වැඩි හා සමස දක්වා ඉදිරි අනුපාතික – මහ බැංකුවට කෙරෙන නියමිත අයැදුමෙනි.

කොන්ත්‍රාත්තු වෙළඳ බැංකුවේ මනාපය පරිදි ගත යුතු වන නමුදු කොන්ත්‍රාත්තු කාලසීමාව ඉකුත් වීමට පෙර ගනු ලැබුවොත් නම් කොන්ත්‍රාත්තුවේ සඳහන් විනිමය අනුපාතිකය අනුව ගතයුතු වෙයි.

## ආසියානු මූල්‍ය ඒකකය, බංගලි දේශ ටාකා, ඉන්දියානු රුපියල, අයිරාන රියාල්, නේපාල රුපියල හා පකිස්ථානු රුපියල සඳහා මහ බැංකු විදුලි පණිවුඩ පැවරුම් විනිමය අනුපාතික

**ආසියානු නිෂ්කාශන සංගමය මගින් කෙරෙන මෙහෙයුම් කටයුතු සඳහා පමණක් අදාළ වේ.**

### විදුලි පැවරුම් සඳහා මහ බැංකු අනුපාතික

| චක්‍රලේඛ අංකය හා ක්‍රියාත්මක වීමේ දිනය | | 1975 නොවැම්බර් 03 වැනි දින අංක 105 දරන චක්‍රලේඛය | | 1975 නොවැම්බර් 17 වැනි දින අංක 108 දරන චක්‍රලේඛය | | 1975 දෙසැම්බර් 01 වැනි දින අංක 110 දරන චක්‍රලේඛය | | 1975 දෙසැම්බර් 17 වැනි දින අංක 11[illegible] දරන චක්‍රලේඛය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | මිළදී ගැනීම | විකුණුම් | මිළදී ගැනීම | විකුණුම් | මිළදී ගැනීම | විකුණුම් | මිළදී ගැනීම | විකුණුම් |
| ආසියානු මූල්‍ය ඒකකය (ආ. මූ. ඒ. 100 ට රුපියල්) | එතැන්* | 894·90 | 895·15 | 893·05 | 893·30 | 898·55 | 893·80 | 904·15 | 904·40 |
| බංගලිදේශ ටාකා (ටාකා 100 ට රුපියල්) | එතැන්** | 51·97 | 52·03 | 51·96 | 52·02 | 51·96 | 52·02 | 51·98 | 52·04 |
| ඉන්දියානු රුපියල් (ඉ. රු. 100 ට රුපියල්) | එතැන්** | 85·20 | 85·26 | 85·20 | 85·26 | 85·20 | 85·26 | 85·59 | 85·65 |
| අයිරාන රියාල් (රියාල් 100 ට රුපියල්) | එතැන්** | 10·93 | 10·95 | 10·88 | 10·90 | 11·00 | 11·02 | 11·13 | 11·15 |
| නේපාල රුපියල් (නේපාල රුපි. 100ට රුපි.) | එතැන්** | 60·58 | 60·64 | 60·32 | 60·38 | 61·00 | 61·06 | 61·70 | 61·76 |
| පකිස්ථාන රුපියල් (පකිස්ථානු රු. 100 ට රු.) | එතැන්** | 76·43 | 76·50 | 76·10 | 76·16 | 76·97 | 77·03 | 77·85 | 77·91 |

සමය දක්වා ඉදිරි
* මිළදී ගැනීම එතැන් මිලෙන් මසකට – වට්ටම් ශත 25 බැගින්
* විකුණුම් එතැන් මිලෙන් මසකට – අධි මිල ශත 25 බැගින්
** මිළදී ගැනීම එතැන් මිලෙන් මසකට – වට්ටම් ශත 01 බැගින්
** විකුණුම් එතැන් මිලෙන් මසකට – අධි මිල ශත 02 බැගින්

කොන්ත්‍රාත්තු වෙළඳ බැංකුවේ මනාපය පරිදි ගතයුතු වන නමුදු කොන්ත්‍රාත්තු කාලසීමාව ඉකුත්වීමට පෙර ගනු ලැබුවේ නම් කොන්ත්‍රාත්තුවේ සඳහන් විනිමය අනුපාතිකය අනුව ගත යුතු වෙයි.

## ආසියානු මූල්‍ය ඒකකය, බංගලි දේශ ටාකා, ඉන්දියානු රුපියල, අයිරාන රියාල්, නේපාල රුපියල හා පකිස්ථානු රුපියල සඳහා වෙළෙඳ බැංකු විනිමය අනුපාතික

### වෙළෙඳ බැංකු විදුලි පැවරුම් අනුපාතික – ලියකියවිලි රහිත

**ආසියානු නිශ්කාශන සංගමය මගින් කෙරෙන මෙහෙයවුම් කටයුතු සඳහා පමණක් අදාළ වේ.**

| | 1975 නොවැම්බර් 03 වැනි දින අංක 106 දරන චක්‍රලේඛය | | 1975 නොවැම්බර් 17 වැනි දින අංක 107 දරන චක්‍රලේඛය | | 1975 දෙසැම්බර් 01 වැනි දින අංක 111 දරන චක්‍රලේඛය | | 1975 දෙසැම්බර් 17 වැනි දින අංක 114 දරන චක්‍රලේඛය | |
|---|---|---|---|---|---|---|---|---|
| | අවම මිලදී ගැනීම | උපරිම විකිණීම | අවම මිලදී ගැනීම | උපරිම විකිණීම | අවම මිලදී ගැනීම | උපරිම විකිණීම | අවම මිලදී ගැනීම | උපරිම විකිණීම |
| ආසියානු මූල්‍ය ඒකකය (ආ. මූ. ඒ. 100 කට රුපියල්) | * | ** | * | ** | * | ** | * | ** |
| බංගලි දේශ ටාකා (ටාකා 100 කට රුපියල්) | 51·94 | 52·05 | 51·93 | 52·04 | 51·93 | 52·04 | 51·95 | 52·06 |
| ඉන්දියානු රුපියල් (ඉ. රු. 100 කට රුපියල්) | 85·17 | 85·28 | 85·17 | 85·28 | 85·17 | 85·28 | 85·56 | 85·67 |
| අයිරාන රුපියල (රියාල් 100 කට රුපියල්) | 10·90 | 10·97 | 10·85 | 10·92 | 10·97 | 11·04 | 11·10 | 11·17 |
| නේපාල රුපියල (නේපාල රු: 100කට රුපියල්) | 60·55 | 60·66 | 60·29 | 60·40 | 60·97 | 61·08 | 61·67 | 61·78 |
| පකිස්ථානු රුපියල (පකිස්ථානු රු: 100 කට රුපි:) | 76·40 | 76·52 | 76·07 | 76·18 | 76·94 | 77·05 | 77·82 | 77·93 |

* මහ බැංකුවේ මිලදී ගැනීම අනුපාතිකයට අඩු එහෙත් ශත –/75 ට නොවැඩි.

** මහ බැංකුවේ විකුණුම් අනුපාතිකයට වැඩි එහෙත් රු. 1·50 ට නොවැඩි.

# ඉන්දියානු රුපියල හා ස්ටර්ලිං පවුම සඳහා මහ බැංකුවේ විනිමය අනුපාතික

| චක්‍රලේඛයේ අංකය හා ක්‍රියාත්මක වීමේ දිනය | චක්‍රලේඛ අංක 1 සංශෝධනය – 1975 නොවැම්බර් 27 | | චක්‍රලේඛ අංක 1 සංශෝධනය – 1975 දෙසැම්බර් 10 | |
|---|---|---|---|---|
| | විදුලි පණිවුඩ පැවරුම් සඳහා මහ බැංකු එතැන් මිළදී ගැනීමේ අනුපාතික | විදුලි පණිවුඩ පැවරුම් සඳහා මහබැංකු එතැන් විකිණීමේ අනුපාතික | විදුලි පණිවුඩ පැවරුම් සඳහා මහ බැංකු එතැන් මිළදී ගැනීමේ අනුපාතික | විදුලි පණිවුඩ පැවරුම් සඳහා මහ බැංකු එතැන් විකිණීමේ අනුපාතික |
| ස්ටර්ලිං (පවුම් 100 ට රුපියල්) | 1559 7/8* | 1561 3/8** | 1559 7/8* | 1561 3/8** |
| ඉන්දියානු රුපියල් (ඉ. රු. 100 ට රුපියල්) | 84 31/32† | 85 1/32†† | 86 1/32† | 86 3/32†† |

සමස දක්වා ඉදිරි —
* එතැන් සඳහා මසකට වට්ටම රුපියලකින් 21/32
** එතැන් සඳහා මසකට අධිමිල රුපියලකින් 21/32
† එතැන් සඳහා මසකට වට්ටම රුපියලකින් 1/32
†† එතැන් සඳහා මසකට අධිමිල රුපියලකින් 1/32

කොන්ත්‍රාත්තු වෙළෙඳ බැංකුවේ මනාපය පරිදි ගත යුතු වන නමුදු කොන්ත්‍රාත්තු කාලසීමාව ඉකුත්වීමට පෙර ගනු ලැබුවේ නම් කොන්ත්‍රාත්තුවේ සඳහන් විනිමය අනුපාතිකය අනුව ගතයුතු වෙයි.

# වෙළෙඳ බැංකුවල විනිමය අනුපාතික

| චක්‍රලේඛ අංකය හා ක්‍රියාත්මක වීමේ දිනය | චක්‍රලේඛ අංක 2 සංශෝධනය – 1975 නොවැම්බර් 27 | | චක්‍රලේඛ අංක 2 සංශෝධනය – 1975 දෙසැම්බර් 10 | |
|---|---|---|---|---|
| | අවම මිළදී ගැනීම් අනුපාතික ලියකියවිලි රහිත විදුලි පැවරුම් | උපරිම විකුණුම් අනුපාතික ලියකියවිලි රහිත විදුලි පැවරුම් | අවම මිළදී ගැනීම් අනුපාතික ලියකියවිලි රහිත විදුලි පැවරුම් | උපරිම විකුණුම් අනුපාතික ලියකියවිලි රහිත විදුලි පැවරුම් |
| ස්ටර්ලිං | | | | |
| (අ) පවුම් 100 හෝ ඊට අඩු ප්‍රමාණයන් | මහ බැංකුවේ මිළට ගැනුම් අනුපාතිකයට පහළින් ප. 1 කට සත 5 කට නොවැඩි | මහ බැංකුවේ විකුණුම් අනුපාතිකයට ඉහළින් පවුමකට සත 2 කට නොවැඩි | මහ බැංකුවේ මිළට ගැනුම් අනුපාතිකයට පහළින් පවුමකට සත 5 කට නොවැඩි | මහ බැංකුවේ විකුණුම් අනුපාතිකයට ඉහළින් පවුමකට සත 2 කට නොවැඩි |
| (ආ) පවුම් 100 ට වැඩි ප්‍රමාණයන් | මහ බැංකුවේ මිළට ගැනුම් අනුපාතිකයට පහළින් ප. 1 කට සත 3 කට නොවැඩි | මහ බැංකුවේ විකුණුම් අනුපාතිකයට ඉහළින් පවුමකට සත 1·5 කට නොවැඩි | මහ බැංකුවේ මිළට ගැනුම් අනුපාතිකයට පහළින් පවුමකට සත 3 කට නොවැඩි | මහ බැංකුවේ විකුණුම් අනුපාතිකයට ඉහළින් පවුමකට සත 1·5 කට නොවැඩි |
| එක්සත් ජනපද ඩොලර් (ඩොලර් 100 ට) | මහ බැංකුවේ මිළට ගැනුම් අනුපාතිකයට පහළින් සත 75 කට නොවැඩි | මහ බැංකුවේ විකුණුම් අනුපාතිකයට ඉහළින් රු. 1/50 කට නොවැඩි | මහ බැංකුවේ මිළට ගැනුම් අනුපාතිකයට පහළින් සත 75 කට නොවැඩි | මහ බැංකුවේ විකුණුම් අනුපාතිකයට ඉහළින් රු. 1/50 කට නොවැඩි |
| * ඉන්දියානු රුපියල් (ඉන්දියානු රුපියල් 100 ට) රුපියල් | 84 15/16 | 85 1/16 | 86 | 86 1/8 |